පාර්ලිමේන්තුවේ පුස්තකාලය
කොළඹ.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 8 දරන
# තුවක්කු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 25 යි

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 10/79.

**තුවක්කු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 8 දරන තුවක්කු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) තුවක්කු ආඥාපනතේ 2 වන වගන්තියේ, "දිසාපතිවරයා" යන අර්ථ කථනයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 182 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

' "කෘෂිකාර්මික කාර්යය" යන්නෙන් පහත සඳහන් දේවලට අදාල කවර වූ හෝ කාර්යයක් අදහස් වේ:—

(i) වී ගොවිතැන් කිරීම, සියලුම ක්ෂේත්‍ර බෝග, සරක්කු සහ කුළුබඩු, කාර්මික බෝග, එළවලු, පළතුරු, මල්, තණබිම් සහ සත්ව ආහාර වැවීම;

(ii) කිරිපට්ටි පාලනය, සතුන් ඇති කිරීම සහ බෝකිරීම; හෝ

(iii) ශාක සහ පළතුරු තවාන්වලට.'.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) එවැනි සෑම බලපත්‍රයක් ම, වැදගත් කරුණු සම්බන්ධයෙන්, "අ" උපලේඛනයෙහි "ඇ" ආකෘතියට හැකිතාක් දුරට සමානව තිබිය යුතු අතර රුපියල් හැටක මුද්දරයක් එහි අලවා තිබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කරනු ලැබීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) එවැනි සෑම බලපත්‍රයක් ම, වැදගත් කරුණු සම්බන්ධයෙන්, "අ" උපලේඛනයෙහි "ඌ" ආකෘතියට හැකිතාක් දුරට සමානව තිබිය යුතු අතර රුපියල් හැටක මුද්දරයක් එහි අලවා තිබිය යුතු ය.".

2—ඒ 46844—11,750 (79/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කරනු ලැබීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2) එවැනි සෑම බලපත්‍රයක් ම, " අ " උපලේඛනයේ " ඒ " ආකෘතියට සාරානුකූල විය යුතු අතර, 17 වන වගන්තිය යටතේ නිෂ්පාදකයන් ලෙස ඒ වන විටත් බලපත්‍රයක් දරන තැනැත්තන් සම්බන්ධයෙන් වන විට මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය. වෙනත් සියලු අවස්ථාවල දී එවැනි සෑම බලපත්‍රයක ම රුපියල් දහයක මුද්දරයක් අලවා තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ :—

" බලපත්‍ර සඳහා මුද්දර ගාස්තු.

24. 23 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන් ම, අවස්ථා වෝචිත පරිදි, යම් කෘෂිකාර්මික කාර්යයක් සඳහා හෝ කෘෂිකාර්මික කාර්යයක් නොවන යම් කාර්ය යක් සඳහා හෝ භාවිත කරනු ලබන යම් තුවක්කු වක් වෙනුවෙන් පහත සඳහන් පරිමාණවලට අනුකූලව මුද්දර මගින් ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.

| | කෘෂිකාර්මික කාර්යයක් සඳහා | | කෘෂිකාර්මික කාර්යයක් නොවන වෙනත් කාර්යයක් සඳහා | |
|---|---|---|---|---|
| | රු. | ශත | රු. | ශත |
| (අ) සෑම බෙහෙත් තුවක්කුවක් සඳහා ... ... | 5 | 0 | 10 | 0 |
| (ආ) සෑම පතරොම් තුවක්කුවක් සඳහා ... ... | 10 | 0 | 20 | 0 |
| (ඇ) සෑම රයිෆල් තුවක්කුවක් සඳහා ... ... | 25 | 0 | 50 | 0 |
| (ඈ) සෑම පිස්තෝලයක් හෝ රිවෝල්වරයක් සඳහා | 50 | 0 | 100 | 0.". |